JMC vLearning
"your virtual learning partner"

# අනුපාත විශ්ලේෂණය

## AAT අදියර III

FAR - මූල්‍ය වාර්තාකරණය


සංදීප ජයසේකර
ACA, B.Sc. (Accounting) Sp. Hons., ACMA (SL), SAT, CIMA Passed Finalist,
Reading for MBA (PIM), CA and CIMA Prize Winner



JMC ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD Estd. 1972

JMC Jayasekera Management Centre (Pvt) Ltd
Pioneers in Professional Education
65/2A, Sir Chittampalam A Gardiner Mawatha, Colombo 02 | T: +94 112 430451 | E: info@jmc.lk | F: +94 115 377917

FARPack18

1

# AAT තෙවෙනි අදියර
# මූල්‍ය වාර්තාකරණය

Sandeepa Jayasekera - JMC

Sandeepa Jayasekera

B.Sc. (Acct.) Hons. Gold Medal Winner, ACA, SAT, ACMA (UK), CGMA (UK), CA Prize Winner for AFR subject in Strategic Level II, CA First in Order of Merit Prize Winner in CAB II Level, CIMA Strategic Level Aggregate Prize Winner, Reading for MBA (PIM-SJP).

1

# අනුපාත විශ්ලේෂණය
# Ratio Analysis

2

# අනුපාත විශ්ලේෂණයක් කියන්නේ?

මූල්‍ය තොරතුරු 2ක් අතරේ තියන සම්බන්ධතාවය

- ප්‍රතිශතයක්
- වාර ගණනක්
- දින ගණනක්

ලෙස ඉදිරිපත් කිරීම

JMC Jayasekera Management Centre (Pvt) Ltd 3

3

ලාභදායීත්ව

කාර්යක්ෂම
තා

ආයෝජන

අනුපාත

තෝලන

ද්‍රවශීලිතා

JMC Jayasekera Management Centre (Pvt) Ltd 4

4

# අනුපාත විශ්ලේෂණයේ පියවර

| | | | |
|---|---|---|---|
| ගණනය කරන්න | පිළිතුර සැලසුම් කිරීම | වාර්තාව ලියන්න | නිගමනය |

5

## අනුපාත විශ්ලේෂණ වාර්තා ව්‍යුහය

**වෙත** : [අදාළ පාර්ශවකරු]
**විසින්** : [ඔබේ තනතුර]
**විෂය** : මූල්‍ය තත්වය සහ කාර්යසාධනය පිළිබඳ විශ්ලේෂණ වාර්තාව [තරඟකරුගේ නම, කර්මාන්තයේ සාමාන්‍යය, පෙර වර්ෂය]
**දිනය** : [දිනය]

**හැඳින්වීම**
මෙම වාර්තාව පදනම් වී ඇත්තේ සපයා දී ඇති මූල්‍ය ප්‍රකාශන සහ ඉහත ගණනය කළ අනුපාත මතය. කාර්ය සාධනය සහ මූල්‍ය තත්ත්වය පිළිබඳ බොහෝ අංශ ආවරණය කළද, වාර්තාව [අරමුණ] පිළිබඳ දෘෂ්ටි කෝණයෙන් විමසා ඇත.

**විශ්ලේෂණය**
[උප මාතෘකාව උදා: ලාභදායීතාවය]
සවිස්තරාත්මක විශ්ලේෂණය
[උප මාතෘකාව උදා: කාර්යක්ෂමතාව]
සවිස්තරාත්මක විශ්ලේෂණය

**නිගමනය**
[ඉහත උප මාතෘකා මත පදනම් වූ විශ්ලේෂණයේ සාරාංශය පහත පරිදි වේ. වැදගත් කරුණු අනාවරණය කරන්න]
මේ සම්බන්ධයෙන් වැඩිදුර පැහැදිලි කිරීමක් අවශ්‍ය නම් ඒ සඳහා මා සම්බන්ධ කර ගැනීමට පසුබට නොවන්න

6

# ලාභදායිත්ව අනුපාත

7

- ලාභදායිත්වය
  - දළ ලාභ අනුපාතය
  - ශුද්ධ ලාභ අනුපාතය
  - යෙදවූ ප්‍රාග්ධනය මත ප්‍රතිලාභ අනුපාතය

8

8

| | |
|---|---|
| දළ ලාභ අනුපාතය | දළ ලාභය /විකුණුම් X 100 |
| ශුද්ධ ලාභ අනුපාතය | බදු පසු ලාභය / විකුණුම් X 100 |
| යෙදවූ ප්‍රාග්ධනය මත ප්‍රතිලාභ අනුපාතය | දිගුකාලීන ණය සඳහා පොලී හා බදුවලට පෙර ලාභය / හිමිකම + පොළී දරණ ණය ගැනීම් X 100 |

9

# දළ ලාභ අනුපාතය

| | |
|---|---|
| කරුණ | පැහැදිලි කිරීම |
| නිර්වචනය | රුපියලක විකුණුම් මත කොපමණ දළ ලාභයක් උපයා ඇත්ද |
| අනාවරණය වන්නේ | නිෂ්පාදන කාර්යක්ෂමතාව<br>මිලකරණ උපායමාර්ගයේ ඵලදායීතාවය |
| අනුපාතය වැඩි වන විට | නිෂ්පාදන කාර්යක්ෂමතාව ඉහළ යයි<br>මිලකරණ උපායමාර්ගවල වෙනස් වේ |

10

# ශුද්ධ ලාභ අනුපාතය

| | |
|---|---|
| කරුණ | පැහැදිලි කිරීම |
| නිර්වචනය | රුපියලක විකුණුම් මත කොපමණ ශුද්ධ ලාභයක් උපයා ඇත්ද |
| අනාවරණය වන්නේ | සමස්ත කාර්යක්ෂමතාව<br>ඵලදායීතාවය |
| අනුපාතය වැඩි වන විට | කාර්යක්ෂමතාව සහ කළමනාකරණය ඉහල යයි<br>සමාගම් වර්ධනය සඳහා ඉතුරුම් වැඩි වේ<br>ලාභාංශ ප්‍රකාශ කිරීමේ හැකියාව ඉහල යයි |

11

# යෙදවූ ප්‍රාග්ධනය මත ප්‍රතිලාභ අනුපාතය


| | |
|---|---|
| කරුණ | පැහැදිලි කිරීම |
| නිර්වචනය | ව්‍යාපාරයට යොදවා ඇති රුපියලක ප්‍රාග්ධනයක් මත කොපමණ මෙහෙයුම් ලාභයක් උපයා ඇත්ද |
| අනුපාතය වැඩි වන විට | • ප්‍රාග්ධනය යෙදවූ ආයෝජන සඳහා ඉහළ ප්‍රතිලාභ ලැබේ<br>• මූල්‍ය සැපයුම්කරුවන්ට වැඩි වටිනාකමක් නිර්මාණය වේ |

12

# ආයෝජන අනුපාත



13






14

# ඉපැයීම් පදනම් කරගත් අනුපාත

| | |
|---|---|
| කොටසක ඉපැයුම | සාමාන්‍ය කොටස් හිමියන්ට අදාළ වන ශුද්ධ ලාභය / සාමාන්‍ය කොටස් හිමියන්ට හිමි බර තැබූ කොටස් ගණන |
| ඉපැයුම් ඵලදා අනුපාතය | කොටසක ඉපැයුම / කොටසක වෙළඳපල මිල X 100 |
| මිල ඉපැයුම් අනුපාතය | කොටසක වෙළඳපල මිල / කොටසක ඉපැයුම |

JMC 15

15

# කොටසක ඉපැයුම

| | |
|---|---|
| කරුණ | පැහැදිලි කිරීම |
| නිර්වචනය | කොටසකට, කොපමණ ඉපැයීම් ප්‍රමාණයක් ජනනය කර තිබේද |
| අනාවරණය වන්නේ | සාමාන්‍ය කොටස් හිමියන් අතර ඉපැයීම් බෙදා හැරීම |
| අනුපාතය වැඩි වන විට | • සාමාන්‍ය කොටස් හිමියන් සඳහා ඉහළ ඉපැයීමක් ජනනය වේ<br>• ලාභාංශ ගෙවීමට වැඩි හැකියාවක් ඇත |

16

16

# ඉපැයුම් ඵලදා අනුපාතය

| | |
|---|---|
| කරුණ | පැහැදිලි කිරීම |
| නිර්වචනය | රුපියලක ආයෝජනයකට, කොපමණ ඉපැයීම් ප්‍රමාණයක් ජනනය කර තිබේද |
| අනාවරණය වන්නේ | • ඉපැයීම් හැකියාව<br>• කොටසක ඉපැයීම් (ප්‍රතිලාභ) සහ කොටසක වෙළඳපල මිල (පිරිවැය) අතර සම්බන්ධතාවය |
| අනුපාතය වැඩි වන විට | • ආයෝජනය සඳහා ඉහළ ඉපැයීමක් ලැබේ |





# මිල ඉපැයුම් අනුපාතය

| | |
|---|---|
| කරුණ | පැහැදිලි කිරීම |
| නිර්වචනය | ආයෝජනය නැවත අයකර ගැනීමට ගතවන කාලය |
| අනාවරණය වන්නේ | • ආයෝජකයින්ගේ විශ්වාසය<br>• ආයෝජකයාගේ අවදානම් රුචිය |
| අනුපාතය වැඩි වන විට | • වර්ධන අපේක්ෂාවන් ඇත<br>• පරිණත සමාගමකි |
| අනුපාතය අඩු වන විට | • හොඳ ප්‍රතිලාභ ලබා දෙයි<br>• සමාගමේ වටිනාකම අවතක්සේරු වී ඇත |

# ලාභාංශ පදනම් කරගත් අනුපාත

| | |
|---|---|
| කොටසක ලාභාංශ | සාමාන්‍ය කොටස් ලාභාංශ / බර තැබූ සාමාන්‍ය කොටස් හිමියන්ට හිමි ඒකක ගණන |
| ලාභාංශ ඵලදා අනුපාතය | කොටසක ලාභාංශ / කොටසක වෙළඳපල මිල X 100 |
| ලාභාංශ ආවරණ අනුපාතය | කොටසක ඉපැයුම / කොටසක ලාභාංශ |
| ලාභාංශ ගෙවීම් අනුපාතය | කොටසක ලාභාංශ / කොටසක ඉපැයුම X 100 |





# කොටසක ලාභාංශ

| කරුණ | පැහැදිලි කිරීම |
|---|---|
| නිර්වචනය | කොටසකට කොපමණ ලාභාංශ ගෙවනු ලැබේද (උපලබ්ධි වූ ප්‍රතිලාභ) |
| අනාවරණය වන්නේ | • තනි කොටසකට ලැබුණු ලාභාංශ |
| අනුපාතය වැඩි වන විට | • ලාභාංශ අපේක්ෂා කරන ආයෝජකයින් දිරිමත් වේ<br>• ලාභාංශ, මුදල් පිටතට ගලා යාමක් බැවින් වර්ධනයට බලපානු ලැබේ |

# ලාභාංශ ඵලදා අනුපාතය

| කරුණ | පැහැදිලි කිරීම |
|---|---|
| නිර්වචනය | රුපියලක ආයෝජනයකට (පිරිවැය) කොපමණ ලාභාංශ (උපලබ්ධි වූ ප්‍රතිලාභ) ගෙවනු ලැබේද |
| අනාවරණය වන්නේ | • කොටසක වෙළඳපල මිලට කරනු ලබන ලාභාංශ ගෙවීම |
| අනුපාතය වැඩි වන විට | • ආයෝජකයින් දිරිමත් වේ<br>• ලාභාංශ මුදල් පිටතට ගලා යාමක් බැවින් වර්ධනයට බලපානු ලැබේ |





# ලාභාංශ ආවරණ අනුපාතය

| කරුණ | පැහැදිලි කිරීම |
|---|---|
| නිර්වචනය | ඉපැයීම් වලින් කොපමණ වාර ගණනක් ලාභාංශ ගෙවිය හැකිද යන්නයි |
| අනාවරණය වන්නේ | • ඉපැයීම් මත ලාභාංශ ආවරණය<br>• ලාභාංශ ප්‍රතිපත්තිය |
| අනුපාතය වැඩි වන විට | • අඩු ලාභාංශයක් ගෙවීම නිසා ආයෝජකයින් අධෛර්යමත් වේ<br>• වර්ධනය සඳහා වාසිදායකයි |

# ලාභාංශ ගෙවීම් අනුපාතය

| | |
|---|---|
| කරුණ | පැහැදිලි කිරීම |
| නිර්වචනය | ඉපැයීම්වලින් කොපමණ ප්‍රමාණයක් සාමාන්‍ය කොටස් හිමියන් අතර බෙදා හරිනු ලැබේද යන්නයි |
| අනාවරණය වන්නේ | • ලාභාංශ ප්‍රතිපත්තිය<br>• ඉපැයීම් රඳවා ගැනීම |
| අනුපාතය වැඩි වන විට | • ආයෝජකයින් දිරිමත් වේ<br>• වර්ධනයට බලපානු ලැබේ |



# ද්‍රවශීලතා අනුපාත

# මූල්‍ය තත්ත්වය

| මූල්‍ය තත්ත්ව ප්‍රකාශය | රු. |
|---|---|
| **ජංගම නොවන වත්කම්** | |
| දේපළ, පිරියත හා උපකරණ | 500 |
| | |
| **ජංගම වත්කම්** | |
| තොග | 200 |
| වෙළඳ ලැබිය යුතු දෑ | 200 |
| මුදල් | 100 |
| **මුළු ජංගම වත්කම්** | 500 |

| මූල්‍ය තත්ත්ව ප්‍රකාශය | රු. |
|---|---|
| **ජංගම නොවන වගකීම්** | |
| ණය | 500 |
| | |
| **ජංගම වගකීම්** | |
| බැංකු අයිරාව | 100 |
| වෙළඳ ගෙවිය යුතු දෑ | 400 |
| **මුළු ජංගම වගකීම්** | 500 |

25

25

# විවිධ ජංගම වත්කම් වර්ග

| | |
|---|---|
| තොගය | • ද්‍රවශීලතාවය අඩුයි |
| කලින් ගෙවීම් | • ද්‍රවශීලතාවය අඩුයි |
| වෙළඳ ලැබිය යුතු දෑ | • ද්‍රවශීලතාවය වැඩියි |
| කෙටිකාලීන ආයෝජන | • ද්‍රවශීලතාවය වැඩියි |
| මුදල් හා මුදල් වලට සමාන දෑ | • ද්‍රවශීලතාවය වැඩියි |

ජංගම අනුපාතය

ක්ෂණික වත්කම් අනුපාතය

26

# ද්‍රවශීලතා අනුපාත (වාර)

| | |
|---|---|
| ජංගම අනුපාතය | ජංගම වත්කම් / ජංගම වගකීම් |
| ක්ෂණික වත්කම් අනුපාතය | (ජංගම වත්කම් – තොගය – කලින් කළ වියදම්) / ජංගම වගකීම් |

JMC 27

27

# ජංගම අනුපාතය

| | |
|---|---|
| කරුණ | පැහැදිලි කිරීම |
| නිර්වචනය | ජංගම වගකීම් රුපියලකට, ජංගම වත්කම් කොපමණ ප්‍රමාණයක් තිබේද |
| අනාවරණය වන්නේ | ජංගම වත්කම් තුළින් ජංගම වගකීම් පියවීම සඳහා පවතින හැකියාව |
| අනුපාතය වැඩි වන විට | ජංගම වගකීම් පියවීමට ඉහළ හැකියාවක් පවතී<br>ඉහළ ද්‍රවශීලතා මට්ටමක් ඇති වේ |

28

JMC

28

## ක්ෂණික වත්කම් අනුපාතය

| | |
|---|---|
| කරුණ | පැහැදිලි කිරීම |
| නිර්වචනය | ජංගම වගකීම් රුපියලකට, ක්ෂණික වත්කම් කොපමණ ප්‍රමාණයක් තිබේද යන්නයි |
| අනාවරණය වන්නේ | ක්ෂණික වත්කම් තුළින් ජංගම වගකීම් පියවීමට ඇති හැකියාව |
| අනුපාතය වැඩි වන විට | ජංගම වගකීම් පියවීමට ඉහළ හැකියාවක් පවතී<br>ඉහළ ද්‍රවශීලතා මට්ටමක් ඇති වේ |





# තෝලන අනුපාත

# තෝලන අනුපාත

ජංගම නොවන වගකීම්

පියවීමේ

හැකියාව





**තෝලන අනුපාතය**

$$\frac{\text{පොලී හිමිකමක් ඇති ණය ගැනීම්}}{\text{හිමිකම්}} \times 100$$

**පොලී ආවරණ අනුපාතය**

$$\frac{\text{බදු පෙර ලාභය + පොළිය}}{\text{පොළිය}}$$

# තෝලන අනුපාතය

| | |
|---|---|
| කරුණ | පැහැදිලි කිරීම |
| නිර්වචනය | හිමිකම් ප්‍රාග්ධනය රුපියලකට, ණය ප්‍රාග්ධනය කොපමණ ප්‍රමාණයක් තිබේද |
| අනාවරණය වන්නේ | ආයතනයක ණය ස්කන්ධ ප්‍රාග්ධන සංයුතිය<br>දිගු කාලීන නුබුන්වත්කම |
| අමතර කරුණු | • > 50% - අධි තෝලනය<br>• 50% -25% - සාමාන්‍ය තෝලනය<br>• <25% - අව තෝලනය |

33

33

# පොලී ආවරණ අනුපාතය

| | |
|---|---|
| කරුණ | පැහැදිලි කිරීම |
| නිර්වචනය | මෙහෙයුම් ලාභයෙන් කොපමණ වාර ගණනක් ණය පොලී ගෙවිය හැකිද යන්නයි |
| අනාවරණය වන්නේ | පොලී ගෙවීම් පියවීම සඳහා ඉපැයීම්වල ප්‍රමාණවත් බව |
| අනුපාතය වැඩි වන විට | • පොලී ගෙවීමේ ඉහළ හැකියාවක් ඇත<br>• තවදුරටත් ණය ලබා ගැනීමේ වැඩි හැකියාවක් ඇත<br>• පොලී ගෙවීම් පැහැර හැරීමේ අවදානම අඩු වේ<br>• නුබුන්වත් අවදානම අඩු වේ |


JMC

34

34

# කාර්යක්ෂමතා අනුපාත


35




36

- ABC විසින් xyz වෙතින් රු. මිලියන 4 ක් වටිනා අමුද්‍රව්‍ය (රෙදිපිළි) මිලදී ගෙන ඇත. සැපයුම්කරු දින 60 ක ණය කාලයක් ලබා දුන්නේය. ඇණවුම ලැබෙන තෙක් රෙදිපිළි දින 21 ක් අමුද්‍රව්‍ය ගබඩාවේ ගබඩා කර ඇත.
- ඉන්පසු අමුද්‍රව්‍ය නිෂ්පාදන ප්‍රවාහයට නිකුත් කරන ලද අතර නිෂ්පාදන කටයුතු දින 07 ක් පුරා සිදු වුණි.
- විකුණන තුරු නිමි තොග ගබඩාවේ දින 15 ක් ගබඩා කරන ලදි.
- නිමි තොග රු. මිලියන 6 කට විකුණන ලදි. ණයගැතියාට දින 30 ක ණය කාලයක් ලබා දී ඇත.
- නියමිත දිනට සැපයුම්කරු පියවීම සඳහා දින 15 ක බැංකු අයිරාවක් ලබා ගන්නා ලදි.
- ණයගැතියා විසින් එම මුදල පියවා අවසන් වූ පසු, බැංකු අයිරාව පියවීම සිදු කෙරිණි.

37




38

| | | |
|---|---|---|
| අමුද්‍රව්‍ය ගබඩාවේ අමුද්‍රව්‍ය දින කීයක් රඳවා තිබුනාද? | දින 21 | අමුද්‍රව්‍ය තොග නේවාසික කාලය |
| වසරකට සාමාන්‍යයෙන් නිෂ්පාදන ප්‍රවාහය සඳහා අමුද්‍රව්‍ය කොපමණ වාර ගණනක් නිකුත් වේද? | 365/21<br>වාර 17 | අමුද්‍රව්‍ය තොග පිරිවැටුම් අනුපාතය |
| අමුද්‍රව්‍ය නිමි තොග බවට පත් කිරීමට දින කීයක් ගතවේද (නිෂ්පාදන කාලය)? | දින 07 | නොනිමි තොග නේවාසික කාලය |
| සාමාන්‍යයෙන් වසරක් තුළ කොපමණ නිෂ්පාදන වාර ගණනක් සිදු කර ඇත්ද? | 365/07<br>වාර 52 | නොනිමි තොග පිරිවැටුම් අනුපාතය |

39

| | | |
|---|---|---|
| නිමි තොග විකිණීමට පෙර ගබඩාවේ දින කීයක් පවතිනවාද? | දින 15 | නිමි තොග නේවාසික කාලය |
| වසරක් තුළ, සාමාන්‍යයෙන් නිමි තොග විකුණන ලද වාර ගණන කොපමණ ද? | 365/15<br>වාර 24 | නිමි තොග පිරිවැටුම් අනුපාතය |
| ණයගැතියන් සඳහා ණය කාලය ලෙස දින කීයක් ලබා දුන්නාද? | දින 30 | ණයගැති එකතුකිරීමේ කාලය |
| වසරකට, සාමාන්‍යයෙන්, වෙළඳ ණයගැතියෙකු කොපමණ වාර ගණනක් නියමිත මුදල් පියවනවාද? | 365/30<br>වාර 12 | ණයගැති පිරිවැටුම් අනුපාතය |

40

| | | |
|---|---|---|
| සැපයුම්කරුවන් විසින් ණය කාලය ලෙස දින කීයක් ලබා දුන්නේද? | දින 60 | ණයහිමි නේවාසික කාලය |
| වසරක් තුළ, සාමාන්‍යයෙන්, ආයතනය විසින් වෙළඳ ණයහිමියෝ කොපමණ වාර ගණනක් පියවා ඇත්තේ ද? | 365/60<br>වාර 06 | ණයහිමි පිරිවැටුම් අනුපාතය |

41

# වත්කම් පිරිවැටුම් අනුපාත (වාර)

| | |
|---|---|
| මුළු වත්කම් පිරිවැටුම් අනුපාතය | විකුණුම්/මුළු වත්කම් |

42

# මුළු වත්කම් පිරිවැටුම් අනුපාතය

| | |
|---|---|
| කරුණ | පැහැදිලි කිරීම |
| නිර්වචනය | රුපියලක වත්කමකින්, යම් කාල පරිච්ඡේදයක් තුළ විකුණුම් කොපමණ වාර ගණනක් ජනනය වී ඇත්ද? |
| අනාවරණය වන්නේ | විකුණුම් ජනනය කිරීම සඳහා වත්කම් භාවිතය |
| අනුපාතය වැඩි වන විට | වත්කම්වල භාවිතය වැඩි වේ<br>වත්කම් අධිතක්සෙරු කිරීම් අඩු වේ<br>නිෂ්ක්‍රීය හා අනවශ්‍ය වත්කම් අඩු වේ |

43

# තොග පිරිවැටුම් අනුපාත (වාර)

| | |
|---|---|
| අමුද්‍රව්‍ය තොග පිරිවැටුම් අනුපාතය | පරිභෝජනය කළ ද්‍රව්‍ය පිරිවැය / අවසාන අමුද්‍රව්‍ය තොගය |
| නොනිමි තොග පිරිවැටුම් අනුපාතය | නිෂ්පාදන පිරිවැය / අවසාන නොනිමි තොගය |
| නිමි තොග පිරිවැටුම් අනුපාතය | විකුණුම් පිරිවැය / අවසාන නිමි තොගය |

44

# තොග පිරිවැටුම් අවශ්‍යතා

| | |
|---|---|
| පරිභෝජනය කළ ද්‍රව්‍ය පිරිවැය | ආරම්භක අමුද්‍රව්‍ය තොගය<br>+ අමුද්‍රව්‍ය මිලදී ගැනීම්<br>(-) අවසාන අමුද්‍රව්‍ය තොගය |
| නිෂ්පාදන පිරිවැය | විකුණුම් පිරිවැය<br>+ අවසාන නිමි තොගය<br>(-) ආරම්භක නිමි තොගය |

45

# තොග නේවාසික කාල අනුපාත (දින)

| | |
|---|---|
| අමුද්‍රව්‍ය තොග නේවාසික කාලය | $\frac{\text{දින } 365}{\text{අමුද්‍රව්‍ය තොග පිරිවැටුම් අනුපාතය}}$ |
| අමුද්‍රව්‍ය තොග නේවාසික කාලය | $\frac{\text{දින } 365}{\text{පරිභෝජනය කළ ද්‍රව්‍ය පිරිවැය}} \times \text{අවසාන අමුද්‍රව්‍ය තොගය}$ |
| නොනිමි තොග නේවාසික කාලය | $\frac{\text{දින } 365}{\text{නොනිමි තොග පිරිවැටුම් අනුපාතය}}$ |
| නොනිමි තොග නේවාසික කාලය | $\frac{\text{දින } 365}{\text{නිෂ්පාදන පිරිවැය}} \times \text{අවසාන නොනිමි තොගය}$ |

46

# තොග නේවාසික කාල අනුපාත (දින)

**නිමි තොග නේවාසික කාලය** = දින 365 / නිමි තොග පිරිවැටුම් අනුපාතය

**නිමි තොග නේවාසික කාලය** = (දින 365 / විකුණුම් පිරිවැය) X අවසාන නිමි තොගය

47

## අමුද්‍රව්‍ය තොග පිරිවැටුම් අනුපාතය

| | |
|---|---|
| කරුණ | පැහැදිලි කිරීම |
| නිර්වචනය | යම් කාල පරිච්ඡේදයක් තුළ නිෂ්පාදනය සඳහා අමුද්‍රව්‍ය කොපමණ වාර ගණනක් නිකුත් කර ඇත්ද |
| අනාවරණය වන්නේ | අමුද්‍රව්‍ය ගබඩාවේ සිට නිෂ්පාදනය දක්වා අමුද්‍රව්‍යවල චංචලතාවය |
| අනුපාතය වැඩි වන විට | ඉක්මණින් චලනය වන අමුද්‍රව්‍ය ඇති වේ<br>සෙමින් චලනය වන තොග අවම වේ<br>හානිකරණ අවදානම, යල් පැන යාමේ අවදානම අවම වේ<br>අමුද්‍රව්‍යවල මුදල් සිර කර තබා ගැනීමේ අවදානම අඩු වේ |

48

## අමුද්‍රව්‍ය තොග නේවාසික කාලය

| | |
|---|---|
| කරුණ | පැහැදිලි කිරීම |
| නිර්වචනය | නිෂ්පාදනය සඳහා නිකුත් කිරීමට පෙර අමුද්‍රව්‍ය ගබඩාව තුළ කොපමණ දින ගණනක් අමුද්‍රව්‍ය තිබුනේද |
| අනාවරණය වන්නේ | අමුද්‍රව්‍යවල චංචලතාවය |
| අනුපාතය අඩු වන විට | ඉක්මණින් චලනය වන අමුද්‍රව්‍ය ඇති වේ<br>සෙමින් චලනය වන තොග අවම වේ<br>හානිකරණ අවදානම, යල් පැන යාමේ අවදානම අවම වේ<br>අමුද්‍රව්‍යවල මුදල් සිර කර තබා ගැනීමේ අවදානම අඩු වේ |

49

## නොනිමි තොග පිරිවැටුම් අනුපාතය

| | |
|---|---|
| කරුණ | පැහැදිලි කිරීම |
| නිර්වචනය | යම් කාල පරිච්ඡේදයක් තුළ නොනිමි තොග කොපමණ වාර ගණනක් නිමි තොග බවට පත් වී ඇත්ද (නිෂ්පාදන කාණ්ඩ ගණන) |
| අනාවරණය වන්නේ | නිෂ්පාදන කාර්යක්ෂමතාව |
| අනුපාතය වැඩි වන විට | ඉක්මණින් චලනය වන නොනිමි තොග ඇති වේ<br>සෙමින් චලනය වන නොනිමි තොග අවම වේ<br>හානිකරණ අවදානම, යල් පැන යාමේ අවදානම අවම වේ<br>නොනිමි තොගවල මුදල් සිර කර තබා ගැනීමේ අවදානම අඩු වේ |

50

## නොනිමි තොග නේවාසික කාලය

| කරුණ | පැහැදිලි කිරීම |
|---|---|
| නිර්වචනය | නිමි තොග වීමට පෙර නොනිමි තොග කොපමණ දින ගණනක් නිෂ්පාදනය තුළ තිබුණේද (නිෂ්පාදන කාලය) |
| අනාවරණය වන්නේ | නිෂ්පාදන කාර්යක්ෂමතාව |
| අනුපාතය අඩු වන විට | ඉක්මණින් චලනය වන නොනිමි තොග ඇති වේ<br>සෙමින් චලනය වන නොනිමි තොග අවම වේ<br>හානිකරණ අවදානම, යල් පැන යාමේ අවදානම අවම වේ<br>නොනිමි තොගවල මුදල් සිර කර තබා ගැනීමේ අවදානම අඩු වේ |

51

## නිමි තොග පිරිවැටුම් අනුපාතය

| කරුණ | පැහැදිලි කිරීම |
|---|---|
| නිර්වචනය | යම් කාල පරිච්ඡේදයක් තුළ නිමි තොග කොපමණ වාර ගණනක් විකිණී ඇත්ද |
| අනාවරණය වන්නේ | නිමි තොගවල සංචලතාව සහ ආදායම් ජනනය කිරීමේ වාර ගණන |
| අනුපාතය වැඩි වන විට | ඉක්මණින් චලනය වන නිමි තොග ඇති වේ<br>සෙමින් චලනය වන නිමි තොග අවම වේ<br>හානිකරණ අවදානම, යල් පැන යාමේ අවදානම අවම වේ<br>නිමි තොගවල මුදල් සිර කර තබා ගැනීමේ අවදානම අඩු වේ |

52

## නිමි තොග නේවාසික කාලය

| | |
|---|---|
| කරුණ | පැහැදිලි කිරීම |
| නිර්වචනය | නිමි තොග විකිණීමට පෙර නිමි තොග ගබඩාව තුළ කොපමණ දින ගණනක් තිබුනේද යන්නයි |
| අනාවරණය වන්නේ | නිමි තොගවල සංචලතාව සහ ආදායම් ජනනය කිරීමේ වාර ගණන |
| අනුපාතය අඩු වන විට | ඉක්මණින් චලනය වන නිමි තොග ඇති වේ<br>සෙමින් චලනය වන නිමි තොග අවම වේ<br>හානිකරණ අවදානම, යල් පැන යාමේ අවදානම අවම වේ<br>නිමි තොගවල මුදල් සිර කර තබා ගැනීමේ අවදානම අඩු වේ |

53

## ණයගැති පිරිවැටුම් අනුපාතය (වාර)

ණයගැති පිරිවැටුම් අනුපාතය

$$\frac{\text{ණයට විකුණුම්}}{\text{අවසාන ණයගැතියෝ}}$$

54

# ණයගැති එකතුකිරීමේ කාලය (දින)

| | |
|---|---|
| ණයගැති එකතුකිරීමේ කාලය | $\frac{\text{දින 365}}{\text{ණයගැති පිරිවැටුම් අනුපාතය}}$ |
| ණයගැති එකතුකිරීමේ කාලය | $\frac{\text{දින 365}}{\text{ණයට විකුණුම්}}$ X අවසාන ණයගැතියෝ |

55

## ණයගැති පිරිවැටුම් අනුපාතය

| | |
|---|---|
| කරුණ | පැහැදිලි කිරීම |
| නිර්වචනය | යම් කිසි කාල පරිච්ඡේදයක් තුළ ණයගැතියෙකු කොපමණ වාර ගණනක් ණය පියවා ඇත්ද යන්නයි |
| අනාවරණය වන්නේ | ණය ආපසු ගෙවීමේ වාර ගණන |
| අනුපාතය වැඩි වන විට | ණය ආපසු අය කරගැනීම් වැඩි වේ<br>ආක්‍රමණශීලී ණය ආපසු අය කරගැනීමේ උපාය මාර්ග<br>ණයගැතියන් හානිකරණය වීමේ අවදානම අඩු වේ<br>පාරිභෝගික සබඳතාවලට සෘණාත්මක බලපෑම් ඇති වේ |

56

## ණයගැති එකතුකිරීමේ කාලය

| | |
|---|---|
| කරුණ | පැහැදිලි කිරීම |
| නිර්වචනය | ණයගැතියෙකුට සාමාන්‍යයෙන් ණය පියවීම සඳහා කොපමණ දින ගණනක් ගතවේද යන්නයි. |
| අනාවරණය වන්නේ | ණයගැතියන් සඳහා ලබා දී ඇති ණය කාලය |
| අනුපාතය අඩු වන විට | ණය ආපසු අය කරගැනීම් වැඩි වේ<br>ආක්‍රමණශීලී ණය ආපසු අය කරගැනීමේ උපාය මාර්ග<br>ගතානුගතික ණය ප්‍රතිපත්තිය<br>ණයගැතියන් හානිකරණය වීමේ අවදානම අඩු වේ<br>පාරිභෝගික සබඳතාවලට සෘණාත්මක බලපෑම් ඇති වේ |

57

## ණයහිමි පිරිවැටුම් අනුපාතය (වාර)

ණයහිමි පිරිවැටුම් අනුපාතය = ණයට ගැණුම් / අවසාන ණයහිමියෝ

58

# ණයහිමි නේවාසික කාලය (දින)

| | |
|---|---|
| ණයහිමි නේවාසික කාලය | දින 365 / ණයහිමි පිරිවැටුම් අනුපාතය |
| ණයහිමි නේවාසික කාලය | දින 365 / ණයට ගැණුම් X අවසාන ණයහිමියෝ |

59

# මූල්‍ය ප්‍රකාශන විශ්ලේෂණයේ සීමාවන්

- අතීත තොරතුරු වීම
- අර්ථ නිරූපණ පුද්ගලයාගෙන් පුද්ගලයාට වෙනස් වීම
- මූල්‍යමය නොවන තොරතුරු නොසළකා හැරීම
- සෘණාත්මක තොරතුරු තුල අර්ථකතනය ගැටළු සහගත වීම
- උද්ධමනය නොසලකා හැරීම
- නිශ්චිත සම්මතයන් නොමැති වීම
- ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වෙනස්කම්
- මූල්‍ය තත්ත්වය එක් දිනක තත්වය පමණක් පෙන්නුම් කරයි
- බිහි සැරසුම් (ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්කම් ආදිය)

JMC Jayasekera Management Centre 60

60

## ප්‍රශ්න අංක 01 - 2019 ජනවාරි ප්‍රශ්න අංක 05

**සීමාසහිත එකෝ ප්‍රොටෙන්ට් ලංකා (පෞද්ගලික) සමාගමේ** 2018 මාර්තු 31 සහ 2017 මාර්තු 31 දිනයන්ට / දිනෙන් අවසන් වර්ෂ සඳහා පිළියෙල කරන ලද මූල්‍ය ප්‍රකාශවලින් පහත සඳහන් තොරතුරු උපුටා ගන්නා ලදි.

*(රු. '000)*

| **දිනෙන් අවසන් වර්ෂය සඳහා** | **2018 මාර්තු 31** | **2017 මාර්තු 31** |
|---|---|---|
| පිරිවැටුම | 220,650 | 199,500 |
| විකුණුම් පිරිවැය | 147,835 | 137,655 |
| දළ ලාභය | 72,815 | 61,845 |
| පොලී සහ ආදායම් බදුවලට පෙර ලාභය | 17,750 | 18,220 |
| වර්ෂය සඳහා වූ ලාභය | 15,620 | 15,820 |
| **දිනට** | **2018 මාර්තු 31** | **2017 මාර්තු 31** |
| තොග | 12,200 | 10,550 |
| වෙළඳ ලැබිය යුතු යුතු මුදල් | 28,200 | 22,500 |
| කොටස්හිමියන්ගේ ස්කන්ධය | 121,030 | 105,410 |
| බැංකු ණය | 9,950 | 10,350 |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය (සාමාන්‍ය කොටස් 1,000,000) | 100,000 | 100,000 |





පහත සඳහන් කර්මාන්ත සාමාන්‍යයන් ද (industry averages) හඳුනාගෙන ඇත:

| | |
|---|---|
| දළ ලාභ අනුපාතය | 40% |
| ශුද්ධ ලාභ අනුපාතය | 12% |
| යෙදවූ ප්‍රාග්ධනය මත ප්‍රතිලාභ අනුපාතය (ROCE) | 8% |
| තොග පිරිවැටුම් අනුපාතය | වාර 10 |
| ණයගැති පිරිවැටුම් අනුපාතය | වාර 9 |
| ණයගැති එකතුකිරීමේ කාලය | දින 40 |

සියළුම විකුණුම් ණය පදනම මත සිදු කරන ලද බවත් වර්ෂයට අදාලව වෙනත් කිසිදු විස්තීර්ණ ආදායමක් නොවූ බවත් උපකල්පනය කරන්න.

**ඔබ විසින් කළ යුතු දෑ:**

ඉහත හඳුනාගන්නා ලද කර්මාන්ත සාමාන්‍යයෙන් සැළකිල්ලට ගනිමින්, **සීමාසහිත එකෝ ප්‍රොටෙන්ට් ලංකා (පෞද්ගලික) සමාගමේ** 2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා / අවසන් දිනට කාර්යසාධනය **විශ්ලේෂණය කරන්න.**

**(මුළු ලකුණු 10)**

# ප්‍රශ්න අංක 01 - 2019 ජනවාරි ප්‍රශ්න අංක 09 (B)

**සීමාසහිත ඉන්ඩොකෙම් පොදු සමාගම** (ICL) සහ **සීමාසහිත ටකසාගෝ (පෞද්ගලික) සමාගමට** (TL) අදාලව 2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත සඳහන් අමතර තොරතුරු ද උපුටාගන්නා ලදි:

| | ICL **(රු.'000)** | TL **(රු.'000)** |
|---|---|---|
| විකුණුම් | 175,000 | 89,000 |
| ගැනුම් | 64,000 | 36,000 |

**(1)** ණයට ගැනුම්, මුළු ගැනුම්වලින් 80% කි.

**(2)** 2017 මාර්තු 31 දිනට ICL සමාගමේ සහ TL සමාගමේ වෙළඳ ගෙවිය යුතු මුදල් පිළිවෙලින් රු. මිලියන 12 ක් සහ රු. මිලියන 6 ක් විය.

**ඔබ විසින් කළ යුතු දෑ:**

සමාගම් දෙකටම අදාලව පහත සඳහන් අනුපාත **ගණනය කරන්න.**

(a) ජංගම වත්කම් අනුපාතය

(b) තෝලන අනුපාතය

(c) ණයහිමි පිරිවැටුම් අනුපාතය (ලකුණු 06)



# ප්‍රශ්න අංක 02 - 2019 ජුලි ප්‍රශ්න අංක 05

**සීමාසහිත සැබ්කෝ සමාගමේ** 2019 මාර්තු 31 සහ 2018 මාර්තු 31 දිනයන්ට/දිනෙන් අවසන් වර්ෂ සඳහා පිළියෙල කරන ලද මූල්‍ය ප්‍රකාශනවලින් පහත සඳහන් තොරතුරු උපුටාගන්නා ලදි:

**විස්තීර්ණ ආදායම් ප්‍රකාශනවල උද්ධෘතයන්** *(රු.'000)*

| **දිනෙන් අවසන් වර්ෂය සඳහා** | **2019 මාර්තු 31** |
|---|---|
| පිරිවැටුම | 220,700 |
| විකුණුම් පිරිවැය | 143,780 |
| දළ ලාභය | 76,920 |
| පොලී සහ ආදායම් බදුවලට පෙර ලාභය | 34,760 |
| ආදායම් බදුවලට පසු ලාභය | 16,177 |

**මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ උද්ධෘතයන්** *(රු.'000)*

| **දිනට** | **2019 මාර්තු 31** | **2018 මාර්තු 31** |
|---|---|---|
| තොග | 25,250 | 16,400 |
| වෙළඳ ලැබිය යුතු මුදල් | 27,580 | 19,850 |
| ස්කන්ධය | 125,600 | 118,000 |
| දිගුකාලීන ණය | 12,000 | 15,600 |

සියළුම විකුණුම් ණය පදනම මත සිදු කරන බව උපකල්පනය කරන්න.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) ඉහත සඳහන් තොරතුරු මත පදනම්ව, 2019 මාර්තු 31 දිනෙන් අවසන් මූල්‍ය වර්ෂය සඳහා පහත සඳහන් අනුපාත **ගණනය කරන්න**:
(i) දළ ලාභ අනුපාතය.
(ii) ණයගැති එකතුකිරීමේ කාලය.
(iii) තොග නේවාසික කාලය.
(iv) යෙදවූ ප්‍රාග්ධනයට ප්‍රතිලාභ [Return on Capital Employed (ROCE)] අනුපාතය.

(ලකුණු 06)

(b) පහත සඳහන් අනුපාතයන් තවදුරටත් වැඩිදියුණු කිරීමට හේතුවිය හැකි කරුණු දෙක(02) බැගින් **ලැයිස්තුගත කරන්න**:
(i) දළ ලාභ අනුපාතය.
(ii) ණයගැති එකතුකිරීමේ කාලය. (ලකුණු 04)

(මුළු ලකුණු 10)





# ප්‍රශ්න අංක 02 - 2019 ජූලි ප්‍රශ්න අංක 09 (B)

අනුපාත විශ්ලේෂණයේ පවතින සීමාවන් තුනක්(03) **පැහදිලි කරන්න**. (ලකුණු 06)

# ප්‍රශ්න අංක 03 - 2020 ජනවාරි ප්‍රශ්න අංක 05

**සීමාසහිත මෙඩිටෙක් (පෞද්ගලික) සමාගමේ** 2019 මාර්තු 31, 2018 මාර්තු 31 සහ 2017 මාර්තු 31 දිනයන්ට / දිනෙන් අවසන් වර්ෂයන් සඳහා පිළියෙල කරන ලද මූල්‍ය ප්‍රකාශනවලින් පහත සඳහන් තොරතුරු උපුටා ගන්නා ලදි:

**විස්තීර්ණ ආදායම් ප්‍රකාශනවල උද්ධෘතයන්** *(රු.'000)*

| **දිනෙන් අවසන් වර්ෂය සඳහා** | **2019 මාර්තු 31** | **2018 මාර්තු 31** | **2017 මාර්තු 31** |
|---|---|---|---|
| පිරිවැටුම | 300,000 | 275,000 | 260,000 |
| විකුණුම් පිරිවැය | 179,960 | 178,425 | 169,450 |
| දළ ලාභය | 120,040 | 96,575 | 90,550 |
| පොලී සහ ආදායම් බදුවලට පෙර ලාභය | 43,000 | 38,000 | 41,250 |
| බදු පසු ලාභය | 27,500 | 28,300 | 27,800 |



**මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ උද්ධෘතයන්** *(රු.'000)*

| **දිනට** | **2019 මාර්තු 31** | **2018 මාර්තු 31** | **2017 මාර්තු 31** |
|---|---|---|---|
| **ජංගම වත්කම්:** | | | |
| තොග | 19,000 | 15,000 | 14,000 |
| වෙළඳ ලැබිය යුතු මුදල් | 40,500 | 27,000 | 21,500 |
| මුදල් සහ මුදල්වලට සමාන දෑ | 8,500 | 6,200 | 7,400 |
| | **68,000** | **48,200** | **42,900** |
| **ස්කන්ධය:** | | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 110,000 | 110,000 | 110,000 |
| රඳවාගත් ඉපැයීම් | 60,000 | 32,500 | 4,200 |
| | **170,000** | **142,000** | **114,200** |
| දිගුකාලීන ණය | 42,000 | 56,000 | 38,000 |
| **ජංගම වගකීම්:** | | | |
| වෙළඳ ගෙවිය යුතු මුදල් | 19,500 | 16,200 | 15,300 |
| ගෙවිය යුතු ආදායම් බදු | 9,500 | 9,100 | 7,600 |
| උපචිත වියදම් | 8,500 | 6,100 | 6,800 |
| | **37,500** | **31,400** | **29,700** |

සියළුම විකුණුම් ණය පදනම මත සිදු කරන බව උපකල්පනය කරන්න.

ඉහත සඳහන් තොරතුරු භාවිතා කරමින්,

**ඔබ විසින් කළ යුතු දෑ:**

පහත සඳහන් අනුපාත ගණනය කරමින්, 2019 මාර්තු 31 සහ 2018 මාර්තු 31 දිනයන්ට / දිනෙන් අවසන් වර්ෂ සඳහා **සීමාසහිත මෙඩිටෙක් (පෞද්ගලික ) සමාගමේ** කාර්යසාධනය **විශ්ලේෂණය කරන්න**:

(a) දළ ලාභ අනුපාතය.

(b) ශුද්ධ ලාභ අනුපාතය

(c) තොග පිරිවැටුම් අනුපාතය

(d) ණයගැති එකතුකිරීමේ කාලය.

(e) යෙදවූ ප්‍රාග්ධනයට ප්‍රතිලාභ [Return on Capital Employed (ROCE)] අනුපාතය.

(ලකුණු 10)



# ප්‍රශ්න අංක 03 - 2020 ජනවාරි ප්‍රශ්න අංක 09 (B)

2019 මාර්තු 31 දිනෙන් සහ 2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂ සඳහා පහත සඳහන් අනුපාතයන් **සීමාසහිත වක්කුඹුර හෝල්ඩිංග්ස් පොදු සමාගම** විසින් ගණනය කර තිබේ:

| | 2018/19 | 2017/18 |
|---|---|---|
| ජංගම අනුපාතය | 1 75 | 1 5 |
| යෙදවූ ප්‍රාග්ධනය මත ප්‍රතිලාභ අනුපාතය (ROCE) | 11% | 13% |
| තොග රඳවා ගැනීමේ කාලය | දින 50 | දින 38 |

**ඔබ විසින් කළ යුතු දෑ:**

2017/18 වර්ෂය සමඟ සසඳා බැලීමේදී ඉහත දැක්වෙන එක් එක් අනුපාතයන් 2018/19 දී වෙනස්වීමට තුඩුදෙනු ඇතැයි සිතිය හැකි හේතු දෙක(02) බැගින් **සඳහන් කරන්න**.

(ලකුණු 06)

# ප්‍රශ්න අංක 04 - 2020 ජූලි ප්‍රශ්න අංක 08

**සීමාසහිත ඩෙල්ටා සමාගමේ** 2020 මාර්තු 31 සහ 2019 මාර්තු 31 දිනයන්ට / දිනෙන් අවසන් වර්ෂ සඳහා පිළියෙල කරන ලද මූල්‍ය ප්‍රකාශනවලින් පහත සඳහන් තොරතුරු උපුටාගන්නා ලදි:

**විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ උද්ධෘතය** *(රු. '000)*

| දිනෙන් අවසන් වර්ෂය සඳහා | 2020 මාර්තු 31 |
|---|---|
| විකුණුම් | 92,500 |
| විකුණුම් පිරිවැය | 62,900 |
| දළ ලාභය | 29,600 |
| පොලී සහ ආදායම් බදුවලට පෙර ලාභය | 10,700 |
| පොලී වියදම් | 2,200 |
| ආදායම් බදුවලට පසු ලාභය | 5,500 |



**මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ උද්ධෘතය** *(රු. '000)*

| දිනට | 2020 මාර්තු 31 | 2019 මාර්තු 31 |
|---|---|---|
| තොග | 15,000 | 16,500 |
| වෙළඳ ලැබිය යුතු මුදල් | 11,700 | 12,700 |
| ජංගම වත්කම් | 31,300 | 34,000 |
| ජංගම වගකීම් | 19,00 | 17,500 |
| ස්කන්ධය | 16,500 | 11,000 |
| දිගුකාලීන ණය | 4,500 | 6,000 |

2019 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා **සීමාසහිත ඩෙල්ටා සමාගම**, පහත සඳහන් අනුපාතයන් ගණනය කර තිබුණි:

| | |
|---|---|
| දළ ලාභ අනුපාතය | 30% |
| ශුද්ධ ලාභ අනුපාතය | 10% |
| ණයගැති එකතුකිරීමේ කාලය | දින 45 |
| තොග නේවාසික කාලය | දින 45 |
| ජංගම අනුපාතය | 1.94:1 |
| පොලී ආවරණ අනුපාතය | වාර 4 |

සියළුම විකුණුම් ණය පදනම මත සිදු කරන බව උපකල්පනය කරන්න.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) ඉහත සඳහන් තොරතුරු මත පදනම්ව, 2020 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා / අවසන් දිනට පහත සඳහන් අනුපාත **ගණනය කරන්න.**

(i) දළ ලාභ අනුපාතය
(ii) ශුද්ධ ලාභ අනුපාතය
(iii) ණයගැති එකතුකිරීමේ කාලය
(iv) තොග නේවාසික කාලය
(v) ජංගම අනුපාතය
(vi) පොලී ආවරණ අනුපාතය

(ලකුණු 06)

(b) පසුගිය වර්ෂය සඳහා ගණනය කරන ලද අනුපාතයන් සැළකිල්ලට ගනිමින්, 2020 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා / අවසන් දිනට **සීමාසහිත ඩෙල්ටා සමාගමේ** කාර්යසාධනය **විශ්ලේෂණය කරන්න.**

(ලකුණු 06)
(මුළු ලකුණු 12)





# ප්‍රශ්න අංක 05 - 2021 ජනවාරි ප්‍රශ්න අංක 08

**සීමාසහිත ශක්ති පොදු සමාගමේ** 2020 මාර්තු 31 දිනෙන් හා 2019 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂ සඳහා පිළියෙල කරන ලද විස්තීර්ණ ආදායම් ප්‍රකාශනවලින් සහ 2020 මාර්තු 31 දිනට හා 2019 මාර්තු 31 දිනට පිළියෙල කරන ලද මූල්‍ය තත්ත්ව ප්‍රකාශනවලින් පහත සඳහන් තොරතුරු උපුටා ගන්නා ලදි:

**විස්තීර්ණ ආදායම් ප්‍රකාශනවල උද්ධෘතයන්** *(රු.'000)*

| දිනෙන් අවසන් වර්ෂය සඳහා | 2020 මාර්තු 31 | 2019 මාර්තු 31 |
|---|---|---|
| විකුණුම් | 300,100 | 275,000 |
| විකුණුම් පිරිවැය | 180,060 | 152,500 |
| දළ ලාභය | 120,040 | 122,500 |
| බදු සහ ණය පොලීවලට පෙර ලාභය | 44,500 | 32,000 |
| බදු පෙර ලාභය | 38,000 | 27,800 |
| බදු පසු ලාභය | 27,500 | 23,500 |

**මූල්‍ය තත්තව ප්‍රකාශන** *(රු.'000)*

| මාර්තු 31 දිනට | 2020 | 2019 |
|---|---|---|
| **වත්කම්:** | | |
| **ජංගම නොවන වත්කම්:** | | |
| දේපළ, පිරියත සහ උපකරණ - ධාරණ අගයට | 125,000 | 120,000 |
| **ජංගම වත්කම්:** | | |
| තොග | 32,000 | 30,000 |
| වෙළඳ ලැබිය යුතු මුදල් | 30,500 | 27,000 |
| මුදල් සහ මුදල්වලට සමාන දෑ | 8,500 | 6,200 |
| දේපළ, පිරියත සහ උපකරණ - ධාරණ අගයට | 125,000 | 120,000 |
| | 71,000 | 63,200 |
| **මුළු වත්කම්** | **196,000** | **183,200** |

Sandeepa Jayasekera - JMC 75

75

| | | |
|---|---|---|
| **ස්කන්ධය සහ වගකීම්** | | |
| **ස්කන්ධය:** | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය (සාමාන්‍ය කොටස් 9,000,000) | 90,000 | 90,000 |
| රඳවාගත් ඉපැයීම් | 15,300 | 5,800 |
| | **105,300** | **95,800** |
| **ජංගම නොවන වගකීම්:** | | |
| දිගුකාලීන ණය | 45,000 | 56,000 |
| **ජංගම වගකීම්:** | | |
| වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු මුදල් | 24,200 | 16,200 |
| ගෙවිය යුතු ආදායම් බදු | 9,500 | 9,100 |
| උපචිත වියදම් | 12,000 | 6,100 |
| | **45,700** | **31,400** |
| **මුළු ස්කන්ධය සහ වගකීම්** | **196,000** | **183,200** |

Sandeepa Jayasekera - JMC 76

76

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) ඉහත සඳහන් තොරතුරු මත පදනම්ව, 2020 මාර්තු 31 දිනෙන් සහ 2019 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂ සඳහා / අවසන් දිනට **සීමාසහිත ශක්ති පොදු සමාගමේ** පහත සඳහන් අනුපාත **ගණනය කරන්න.**

(i) දළ ලාභ අනුපාතය

(ii) ශුද්ධ ලාභ අනුපාතය

(iii) ක්ෂණික වත්කම් අනුපාතය

(iv) යෙදවූ ප්‍රාග්ධනය මත ප්‍රතිලාභය ඃසෘඑමරබ දබ ක්වසඑ්ක ඐපවකදහඪ ඃසෘධඍ**

(v) තෝලන අනුපාතය

(vi) කොටසක ඉපැයුම (ලකුණු 06)

(b) ඉහත ගණනය කරන ලද අනුපාතයන් මත පදනම්ව, **සීමාසහිත ශක්ති පොදු සමාගමේ** කාර්යසාධනය **විශ්ලේෂණය කරන්න.** (ලකුණු 06)

**(මුළු ලකුණු 12)**